# <u>රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය</u>

## ශිෂ්‍ය එකගතාවය

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා කාලය අවුරුදු තුනක් වන අතර එම කාලය තුල විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක ලෙස මම පහත කරුණු වලට එකගතාවය පල කරමි.

1. පාඨමාලාව අවසන් වන තුරු පාඨමාලා කාලය තුළ අධ්‍යයන පටිපාටියට අනුකූලව සියලු අධ්‍යයන කටයුතු වලට උනන්දුවෙන් දායක වන බවට,
2. ආයතනයේ නීතිරීති හා රෙගුලාසි වලට යටත්ව කටයුතු කිරීමට,
3. නියමිත වෙලාවට දේශණ සදහා සහභාගී වී සෑම විෂයක් සදහාම පැමිණීම 80% ඉක්මවීමට වගබලා ගැනීමට,
4. ආයතනයේ කීර්තිනාමයට සරිලන පිළිවෙලට ක්‍රමානුකූල ඇඳුමෙන් සැරසී පැමිණීමට,
5. ආයතනයට පැමිණි සැමවිටම ශිෂ්‍ය හැදුනුම්පත රැගෙන ඒමට සහ අවශ්‍ය කුමන අවස්ථාවකදී වුවද ඉදිරිපත් කිරීමට,
6. අධ්‍යයන කාලය තුළ අනවසරයෙන් ආයතනයෙන් බැහැර නොවීමට,
7. ආයතනයේ සියලු දෙනාටම ආචාරශීලී වීමට හා විනීත වීමට,
8. පනවා ඇති සියලු ආරක්ෂක විධි විධාන පිළිපැදීමට,
9. නොදන්වා දින දෙකකට වඩා නොපැමිණි අවස්ථාවක ඒ සදහා පිළිගතහැකි හේතුන් ලිඛිතව පාඨමාලා සම්බන්ධිකාරක තුමා හෝ තුමිය වෙත ඉදිරිපත් කිරීමට,
10. ආයතන භූමිය තුළ දුම් බිමෙන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමට,
11. ආයතනයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පූර්ණ සහයෝගය ලබා දීමට,
12. ආයතනික දේපල සහ පරිසරය ආරක්ෂා කිරීමට හා රැකබලාගැනීමට,
13. කුමන අන්දමේ හෝ ප්‍රචණ්ඩ ක්‍රියා,විනය කඩ කිරීම්, වර්ජනය කිරීම් හෝ නවක වදය ආදිය සංවිධානය, සහභාගී වීම හා සහයෝගය දීමෙන් වැළකීමට,
14. සෙමෙස්තර හා අවසාන විභාග සදහා පනවා ඇති නීතිරීති අනුව කටයුතු කිරීමට,
15. සැමවිටම සැමතැනකම ආයතනයේ ගරුත්වය හා කීර්තිනාමය ආරක්ෂා කිරීමට.
16. විද්‍යායතනයේ පාඨමාලාවන් අවසානයේදී NVQ 07 මට්ටමට ප්‍රවේශ වීම සදහා සහතික විය නොහැකි බව,
17. වෛද්‍ය හේතු මත පාඨමාලාවේ කටයුතු සදහා සහභාගි නොවන අවස්ථාවකදී එම කාලය වෙනුවෙන් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන බව සහ එම වෛද්‍ය සහතිකය, නිවාඩු අවසාන කොට නැවත පැමිණෙන පළමු දිනයේදීම ආයතනයට ඉදිරිපත් කලයුතු බව,
18. එමෙන්ම ආයතනය වෙත භාරදෙන ලද මොනයම් හෝ සහතිකයක් පාඨමාලා කාලය තුල නැවත ඉල්ලා නොසිටින බව,

(මීලග පිටුව)

එමෙන්ම,

වෙනත් විශ්ව විද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවන් හැදෑරීම සඳහා මා ලියාපදිංචි වී නොමැති අතර, එවැනි ලියාපදිංචි වීමක් හෙළිදරව් වුවහොත්, මෙම පාඨමාලාවේ ලියාපදිංචිය වහාම අවලංගු වන බව මම දනිමි.

එමෙන්ම රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ........................................................................................
පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන අදදින මා විසින් භාරදුන් සියලුම සහතික සහ ලියවිලි නිවැරදි සහ සත්‍ය ඒවා බවත්, එහි යම් දෝෂ සහගත තත්වයක් හෝ සාවද්‍ය භාවයක් අනාවරණය වුවහොත් එම කරුණු මාගේ ශිෂ්‍ය භාවය අවලංගු වීමට හේතු වන බවද මම පිළිගනිමි.

## ප්‍රකාශය

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක ලෙස සිටින කාලය තුළ විද්‍යයතනයේ නියෝග හා නීති රීති මා කෙරෙහි අදාළ වනතාක් දුරට නිසියාකාරව පිළිපදින බව මෙයින් ප්‍රකාශ කරමි. රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ගත කරන කාලය තුළ කිසිදු අවස්ථාවක විනය කඩ කෙරෙන ක්‍රියාවක කිසිම අයුරකින් නොයෙදෙන බවද එවැනි ක්‍රියාවන්ට අනුබල දීමෙන් සැමවිටම වැළකෙන බවද මෙයින් තව දුරටත් ප්‍රකාශ කර සිටිමි.

තවද මෙම ප්‍රකාශයෙහි සඳහන් කොන්දේසි පිළිපැදීමට යම් හෙයකින් අපොහොසත් වූවහොත් මට විරුද්ධව විනයනුකූලව ක්‍රියාමාර්ගයක් ගැනීමට හා ශිෂ්‍ය භාවය අහෝසි කිරීමට අවකාශ ඇති බව මම දනිමි.

ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ නම : ........................................................................................

පාඨමාලාව : ........................................................................................

ලිපිනය : ........................................................................................

........................................................................................

හැඳුනුම්පත් අංකය : ........................................................................................

..................................................		..........................................................................................

දිනය		ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ අත්සන